කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

මැයි - 2023

**BMGT E2065 - සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය: පැය 03 යි

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක එක (01) අනිවාර්ය** වන අතර තවත් **ප්‍රශ්න තුනකට (03)** පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක 01

"ස්ටාර් ෂයින් පුද්ගලික සමාගම" වෙළඳපොලේ විශේෂිත කොටසකට ක්‍රීඩා සපත්තු නිෂ්පාදනය කරයි. සමාගම සෑම මසකම විවිධ මෝස්තර සපයන අතර කර්මාන්ත ශාලා හයකින් සමන්විත වේ. පාරිභෝගිකයින්ගේ වයස් වෙනස්කම්, අවශ්‍යතා වර්ගය අනුව නිෂ්පාදන සැලසුම වෙනස් වේ; සාමාන්‍ය ඇඳුම්, ක්‍රීඩා ඇඳුම්, කාර්යාල ඇඳුම් ආදිය සඳහා විවිධ මිල ගණන් අය කරනු ලැබේ. ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට සහ ක්‍රීඩාවට සම්බන්ධ නව ඉලක්ක කණ්ඩායම්වලට පහසුකම් සැලසීමට පොළොන්නරුව සහ කොළඹ නව කර්මාන්තශාලා පිහිටුවීමට සමාගම අපේක්ෂා කරයි. සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා නව කර්මාන්තශාලා ඇතුළු සියලුම විවිධ ශාඛාවන් සඳහා එක් මානව සම්පත් කළමනාකරුවෙකු සහ එක් මූල්‍ය කළමනාකරුවෙකු පමණක් සේවයේ යෙදවීමට අපේක්ෂා කරයි. නව ඉලක්ක වෙළඳපොලවල් සහ වෙළඳපල වෙත ඉදිරිපත් කළ හැකි විවිධ නිෂ්පාදන ප්‍රභේදන හරහා භූගෝලීය ප්‍රදේශ වැඩි ප්‍රමාණයක් ආවරණය කිරීමට ආයතනය අවධානය යොමු කරයි.

අ) නව කර්මාන්තශාලා සඳහා බාහිර (සාර්ව) එනම් පොදු හා කාර්ය පරිසරය බලපෑම් කළ හැක්කේ කෙසේද?

(ලකුණු 10)

ආ) පවතින ශාඛාවන් හා සසඳන විට නව ශාඛාව පිළිබඳව අලුතින් සැලකිලිමත් විය යුතු පැතිකඩයන් මොනවාද?

(ලකුණු 10)

ඉ) "ස්ටාර් ෂයින් පුද්ගලික සමාගමට" ඔබ යෝජනා කරන ආයතනික ව්‍යුහය කුමක්ද? සාධාරණ හේතු සපයා ඔබේ යෝජනාව සඳහා රූපමය ව්‍යුහයක් ලබා දෙන්න.

(ලකුණු 20)

**(මුළු ලකුණු 40)**

ප්‍රශ්න අංක 02

අ) ආයතනික ජීවන චක්‍රය අවධීන් සැබෑ ලෝකයෙහි දක්නට ලැබෙන උදාහරණයක් ඇසුරින් ඇද විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) සංවිධානයක සාර්ථකත්වය සඳහා ආයතනික සංස්කෘතියක කාර්යභාරය කුමක්ද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) "අද, සාර්ථක සමාගම්, සාම්ප්‍රදායික ව්‍යාපාරික සීමාවෙන් බැහැරව වෙනත් ආයතන ගණනාවක් සමඟ සබඳතා ගොඩනගා ගනී". අන්තර්-සංවිධාන සබඳතාව පවත්වාගෙන යාමේදී කළමනාකරණයේ වෙනස්වන භූමිකාව විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) "සම්පත් යැපීම" අඩු කිරීම සඳහා සංවිධාන විසින් භාවිතා කරන උපාය මාර්ග සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) "සංවිධානයක් වඩාත් හොඳින් ක්‍රියාත්මක වන්නේ සමාජ සහ තාක්ෂණික පද්ධති එකකට එකක් ගැලපෙන පරිදි නිර්මාණය කර ඇති විටය". "සමාජ තාක්‍ෂණික පද්ධති ප්‍රවේශයේ" වැදගත්කම ඉස්මතු කරමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) ආයතන සේවකයින්ගේ රැකියා නිර්මාණය කෙරෙහි නව තාක්ෂණය හඳුන්වාදීමේදී ඇති කරන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **05**

ඩිජිටල් ඔෆිස් සමාගම යනු එක්සත් ජනපදයේ ප්‍රමුඛතම මෘදුකාංග සංවර්ධන සමාගමකි. විදේශයන්හි වෙළඳපොලවල් සොයමින් සිටියදී, සමාගම විසින් ඉන්දියානු රජය ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ප්‍රතිව්‍යුහගත කරන බව සොයා ගන්නා ලදී. සරල කරන ලද අපනයන ප්‍රතිපත්ති සහ ඉන්දියාවේ තීරුබදු සීමා ඉවත් කිරීමේ වාසිය ලබා ගැනීමට සමාගම තීරණය කළේය. ඊට අමතරව, ඔවුන් ඉන්දියාවේ ව්‍යාපාරය කරගෙන යන විට අඩුම මිලට පුහුණු ශ්‍රමිකයන් සොයා ගත හැකි බව හඳුනාගෙන ඇත. එබැවින්, ඉන්දියානු වෙළඳපොළ අල්ලා ගැනීමේ අරමුණින් ඩිජිටල් ඔෆිස් සමාගමේ කාර්යාලයක් දිල්ලියේ පිහිටුවීමට තීරණය කළේය.

අ) ඩිජිටල් ඔෆිස් සමාගමේ ගෝලීය ව්‍යාප්තිය සඳහා වූ අභිප්‍රේරණ හඳුනා ගන්න.

(ලකුණු 10)

ආ) ඩිජිටල් ඔෆිස් සමාගම ඉන්දියාවේ තම ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන අභියෝග මොනවාද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **06**

අ) "බලය යනු වෙනත් පුද්ගලයෙකුගේ හැසිරීමට බලපෑම් කිරීමට පුද්ගලයෙකුට ඇති හැකියාවයි". අන්තර් පුද්ගල බලයේ මූලාශ්‍ර පහ (05) විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) සංවිධානවල බලය ලබා ගැනීම සඳහා භාවිතා කරන දේශපාලන ක්‍රම සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**